# බේරෙන පැණි බිඳු

@Chords: Chandana Hewage

©LankaSongBook - ලංකා ගී පොත

C Am C G
බේරෙන පැණි බිඳු රතු මීවද බඳු පැණි රඹුටන් ගස් ගානේ
F G C F Dm G C
ලේනුන් ගිරවුන් පලවා හරිමින් ටකය බැඳෙන මල් වානේ
C Am C Dm G C
කුමරිය ඔබ මා දිනූ ගමයි මා සතු වස්තුව ඔබමම තමයි

C F G C
රැපු බිය වද්දන පෙර ජය වද්දන පුරයයි ඈත පෙනෙන්නේ
F G C F Dm G C
කැළණියෙ බෝ පත් පිස එන සුළඟින් ඔබ සිල් සුවය ලබන්නේ
C Am Dm G Dm G C
මිණි මුතු වන් මල් දිවා රැයේ ඔබ පින්බරියකි කුමාරියේ

C F G C
ගොයම් කපද්දී පුරන් කොටද්දී කුඹුරට බැස යන ගොවියෝ
F G C F Dm G C
කැව්ලි පෙව්ලි බත බුලත රැගෙන එන නාඹර මේ ගම් දැරියෝ
C Am Dm G Dm G C
සිවමින් දෙසවන අම් බිංදු ගයමින් සී පද කවි සිංදු